**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී උපාධි දෙවන වසර පරීක්ෂණය (විශේෂ උපාධි)**

**දෙවන සෙමෙස්තරය - 2017/2018**

**SLG 2229- සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය (ද්විතීය තරංගය)**

**(පැ දෙකයි)**

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

1. හතරවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජ්‍ය සමය තුළ දී සිංහල භාෂාවෙත් ජාතිකත්වයේත් උද්දීප්තිය උදෙසා මෙහෙයවුණු සාහිත්‍ය ව්‍යාපාරයක් ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ විමසීමක් කරන්න.

2. යොවුන් දිවියක අභියෝග ජය ගැනීම උදෙසා පැසුණු බුද්ධියෙන් යුතු ගුරුවරයකු විසින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රශස්ත උපදෙස් මාලාවක් ලෙස එළුඅත්තනගලුවංසයෙහි නන්ද තෙරුන්ගේ අනුශාසනාව විමසීමට ලක් කරන්න.

3. "නූතන සාහිත්‍ය විචාරයෙහි ලා භාවිත නිර්ණායක අනුව වුව ද අගය කළ හැකි ආකාරයේ බොහොමයක් ජාතක කතා, පන්සියපනස්ජාතක පොතෙහි අන්තර්ගතය." මේ පිළිබඳ විමසුමක් කරන්න.

4. සිය කෘතිය ධර්ම ව්‍යාඛ්‍යානයක් ලෙස සද්ධර්මාලංකාර කතුවරයා විසින් හඳුන්වනු ලැබීම එම ග්‍රන්ථයෙහි අන්තර්ගතය හා සසඳන කල කොතෙක් දුරට සාධාරණ වේදැයි නිදර්ශනාත්මකව විමසන්න.

5. "වෘත්තගන්ධි ශෛලියෙන් රචිත දළදා සිරිතේ විවිධාකාරයේ අනුප්‍රාසාත්මක යෙදුම් බහුලව දක්නට ඇත." මේ පිළිබඳ විමසුමක යෙදෙන්න.

අ. පි. බ.

6. කෙටි සටහන් ලියන්න.

I. ථූපවංශය

II. සංඝබෝධි කුමාරයාගේ බලය පිළිබඳ විවරණ

III. අසිලක්ඛණ ජාතකයෙන් ඉස්මතු වන හාස්‍යය

IV. උම්මග්ග ජාතකයෙහි කේවට්ට චරිතය

***   ***   ***   ***   ***